# දඟ හොඳ නෑ පොඩි සමනල් පැටියෝ..



තිමන්දී දිලේන්‍යා ජයවීර

# දඟ හොඳ නෑ පොඩි සමනල් පැටියෝ..



තිමන්දී දිලේන්‍යා ජයවීර

# දඟ හොඳ නෑ පොඩි සමනල් පැටියෝ...

ප්‍රථම මුද්‍රණය 2023

ISBN

**පිට කවරය, කතාව සහ චිත්‍ර**

තිමන්දී දිලේන්යා ජයවීර

**පරිගණක අක්ෂර සංයෝජනය හා පිටු සැකසීම**

ලක්ෂිකා පතිරණ

©ලක්ෂිකා පතිරණ

+94 773 92 9545

සියලු අයිතිය කර්තෘ සතුය.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි  එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මඟපෙන්වීම යටතේ  ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොටගෙන ග්‍රන්ථකරණයට  යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ  සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් 'දිවිය දිනන විද්‍යුත් පොතක්' ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි. 2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ 'දිවිය දිනන විද්‍යුත් පොතක්' ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලෙඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමණාකරණ මණ්ඩලය ගුරු භවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරු භවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමඟින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023.11.10

# දැඟ හොඳ නෑ පොඩි සමනල් පැටියෝ..

ඔන්න එකෝමත් එක කාලෙක එක සමනල් පවුලක් හිටියා. ඒ පවුලේ හිටියේ සමනල් අම්මා, තාත්තා සහ පුංචිම පුංචි සමනල් පැටියෙකුයි. ඒ පුංචි සමනල් පැටියාට තාම කතා කරගන්නවත් බෑ. ඒ තරම් පොඩියි. එයා හරිම ආසයි එළියට ගිහින් යාළුවොත් එක්ක සෙල්ලම් කරන්න. ඒත් අම්මා එයාට තනියම යන්න දුන්නේ නෑ කරදරයක් වෙයි කියලා.

සමනල් පැටියා ටික ටික ලොකු වුණා. එයා ටික ටික දැඟ වෙන්න පටන් ගත්තා. ඔන්න එක දවසක් සමනල් පැටියාට එළියට ගිහින් යහළුවෝ එක්ක

සෙල්ලම් කරන්න යන්න හිතුණා. එයා "අම්මේ, මම මගේ යාළුවොත් එක්ක සෙල්ලම් කරන්න යන්නද?" කියලා  අම්මගෙන් ඇහුවා. "අනේ පුතේ, අද මම විතරයි ගෙදර ඉන්නේ. තාත්තාත් ගෙදර නෑනේ. හෙටත් නෑ. අනිද්දට තාත්තා ඉන්නවා. ඔයා තාත්තා ත් එක්ක යන්න" කියලා අම්මා කිවුවා.

සමනල් පැටියා "හරි අම්මේ" කියා සාලයට ගොසින් කල්පනා කර කර හිටියා. රෑ බෝ වුණා. සමනල් පැටියට දන්නෙම නැතුව නින්ද ගියා. එක දවසක් ගත වුණා. සමනල් පැටියට ඉවසගන්නම බැරි වුණා. ඊට පස්සෙ සමනල් පැටියා අම්මාට හොරෙන් යහළුවන් සමඟ සෙල්ලම් කිරීමට ගියා.



යහළුවන් හැමෝම ඇවිත් හිටියේ අම්මලා එක්ක. සමනල් පැටියාගේ හොඳම යාළුවා මෙහෙම ඇහුවා. " කෝ ඔයාගේ අම්මා?"

"ම... මගේ අම්මා එහා පැත්තේ යාළුවෙක් එක්ක ක... කතා කර කර ඉ... ඉන්නවා..." කියලා සමනල් පැටියා අමාරුවෙන් බොරු කිව්වා.

මේ අතර ගෙදර සමනල් පැටියා ගේ ගෙදර හරිම කලබලයක්. සමනල් පැටියා ගේ අම්මා සමනල් පැටියාව අඬමින් සොයනවා. "අනේ පුතේ... ඉහ්... ඉහ්... ඉහ්... ඔයා කොහෙද ඉන්නේ....?" අම්මා හැම තැනම හොයනවා.

ටික වෙලාවකින් සමනල් අම්මලා සහ සමනල් යහළුවෝ ගෙදර යාමට පිටත් වුණා. සමනල් පැටියාත් ගෙදර යන්න පිටත් වුණා. සමනල් පැටියාට ගෙදර යන්න පාර අමතක වුණා. සමනල් පැටියා බය වී අඬන්න පටන් ගත්තා. "අනේ ඉහ්... ඉහ්... ඉහ්... අම්මේ... තාත්තේ... මගේ උදවුවට කවුරුත් නැද්ද? අනේ... ඉහ්.... ඉහ්.... ඇෑ.......ඇෑ...... අනේ..... මාව බේර ගන්න..." සමනල් පැටියා හොඳටම ඇඬුවා....

ඊට පස්සේ කවුරුත් නැතුව පුංචි සමනල් පැටියා එක දවසක් තනියම නිදාගත්තා. සමනල් පැටියාට හොඳටම දුක හිතුනා. බයත් හිතුනා.

ඊළඟ දවසේ සමනල් පැටියා ආයෙත් අඬ අඬා යන්න පටන් ගත්තා. ලොකු සුළඟක් හැමුවා. සමනල් පැටියා වීසි වෙවී ඈතට ඈතට ගියා.

"අම්මේ.... තාත්තේ.... අනේ... මාව බේර ගන්න."

සමනල් පැටියා සොයමින් හිටි අම්මාට මේ සද්දේ ඇහුණා. අම්මා දුවගෙන සද්දේ එන දිහාට ආවා. අඬමින් සිටි සමනල් පැටියා දැකලා අම්මා "අනේ මගේ පුතේ... ඔයා කොහේද ගියේ? මගේ පුතේ, මම ඔයාට කිවුවනේ මගෙන් අහන්නේ නැතිව කොහේවත් යන්න එපා කියලා."

"මම ආයේ කවදාවත් අම්මා කියන දේ අහන්නේ නැතිව ඉන්නේ නෑ." සමනල් පැටියා දුකෙන් කිව්වා.





“ඕක තමයි වෙන්නේ දෙමවුපියෝ, ගුරුවරු කියන දේ ඇහුවේ නැත්නම්.” අම්මා කිවුවා.

ඊට පස්සේ සමනල් පැටියා අම්මාට තාත්තාට කීකරුව සතුටින් ජීවත් වුණා.

# නිමි!





**තිමන්දී දිලේන්යා ජයවීර**

**මහාමායා බාලිකා විදුහල**

**මහනුවර**

## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගි ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදන වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මඟපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ
2023.11.01